ශ්‍රී ලංකා

ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ

පාර්ලිමේන්තුව

---

# 1984 අංක 30 දරන නවීන තාක්ෂණ විද්‍යා පිළිබඳ ආතර් සී. ක්ලාක් මධ්‍යස්ථානය පනත

---

[සහතිකය සටහන් කළේ 1984 ජූලි මස 05 වන දින]

ආණ්ඩුවේ නියමය පරිදි මුද්‍රණය කරන ලදී.

---

1984 ජූලි මස 06 වැනි දින ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ II වන කොටසේ අතිරේකයක් වශයෙන් පළ කරන ලදී.

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී

කොළඹ රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිලදී ලබාගත හැක.

මිල : රු. 1.20 යි. තැපැල් ගාස්තුව : ශත 60 යි.

# 1984 අංක 30 දරන නවීන තාක්ෂණ විද්‍යා පිළිබඳ ආතර් සී. ක්ලාක් මධ්‍යස්ථානය පනත

[සහතිකය සටහන් කළේ 1984 ජූලි මස 05 වන දින.]

එල්. ඩී.—ඕ. 20/83.

**නවීන තාක්ෂණ විද්‍යා පිළිබඳ ආතර් සී. ක්ලාක් මධ්‍යස්ථානය පිහිටුවීම සඳහා සහ පණිවුඩ හුවමාරුව, පරිගණක විද්‍යාව, බලශක්ති, අභ්‍යවකාශ තාක්ෂණ විද්‍යා සහ රොබෝ විද්‍යාව අධ්‍යයනය කිරීම සඳහා ද ඊට සම්බන්ධ සහ ආනුෂංගික කරුණු සඳහා ද විධිවිධාන සැලැස්වීම පිණිස වූ පනතකි.**

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව විසින් මෙසේ පනවනු ලැබේ :—

**1.** මේ පනත 1984 අංක 30 දරන නවීන තාක්ෂණ විද්‍යා පිළිබඳ ආතර් සී. ක්ලාක් මධ්‍යස්ථානය පනත යනුවෙන් හඳුන්වනු ලබන අතර ගැසට් පත්‍රයේ පළ කරනු ලබන නියමයක් මගින් අමාත්‍යවරයා විසින් නියම කරනු ලබන දිනයක සිට එය ක්‍රියාත්මක විය යුතු ය.

ලුහුඬු නාමය සහ ක්‍රියාත්මක වීමේ දිනය.

## I වන කොටස

### නවීන තාක්ෂණ විද්‍යා පිළිබඳ ආතර් සී. ක්ලාක් මධ්‍යස්ථානය

**2.** (1) මෙහි මින් මතු "මධ්‍යස්ථානය" යනුවෙන් සඳහන් කරනු ලබන "නවීන තාක්ෂණ විද්‍යා පිළිබඳ ආතර් සී. ක්ලාක් මධ්‍යස්ථානය" යනුවෙන් හඳුන්වනු ලැබිය යුතු මධ්‍යස්ථානයක් පිහිටුවනු ලැබිය යුතු ය.

නවීන තාක්ෂණ විද්‍යා පිළිබඳ මධ්‍යස්ථානය සංස්ථාගත කිරීම.

(2) මධ්‍යස්ථානය (1) වන උපවගන්තිය මගින් ඊට දෙන ලද නාමයෙන් සංස්ථාවක් විය යුතු ය; තවද ඊට අවිච්ඡින්න පැවැත්මක් හා පොදු මුද්‍රාවක් තිබිය යුතු අතර ඒ නාමයෙන් එය විසින් නඩු පැවරීම ද එයට විරුද්ධව නඩු පවරනු ලැබීම ද කළ හැකි ය.

(3) මධ්‍යස්ථානයේ මුද්‍රාව—

(අ) මණ්ඩලය විසින් කලින් කල තීරණය කරනු ලබන තැනැත්තකුගේ භාරයේ තිබිය යුතු ය;

(ආ) මණ්ඩලය විසින් තීරණය කරනු ලබන ආකාරයට වෙනස් කරනු ලැබිය හැකි ය; තවද

(ඇ) මණ්ඩලයේ අවසරය ඇතුව මණ්ඩලයේ සාමාජිකයන් දෙදෙනකු ඉදිරිපිට දී මිස, කිසිම ලේඛනයකට නොතබනු ලැබිය යුතු ය. තවද, ඔවුන් දෙදෙනා තමන් පැමිණ සිටින බවට සාක්ෂියක් වශයෙන් ලේඛනයෙහි අත්සන් කළ යුතු ය.

3. ප්‍රහුණුවීමේ පහසුකම් හා පර්යේෂණ පහසුකම් සලසා දීම මගින් පණිවුඩ හුවමාරුව, පරිගණක විද්‍යාව, අභ්‍යවකාශ තාක්ෂණ විද්‍යාව, බලශක්ති සහ රොබෝ විද්‍යාව යන ක්ෂේත්‍රවලට නවීන

මධ්‍යස්ථානයේ අරමුණු සහ පරමාර්ථ.

ඒ 076549—6,250 (84/05)

තාක්ෂණ විද්‍යා හඳුන්වා දීමේ ක්‍රියාවලිය සහ එම ක්ෂේත්‍රවල නවීන තාක්ෂණ විද්‍යා වැඩි දියුණු කිරීම, කඩිනම් කිරීම, සහ විශේෂයෙන් පහත දැක්වෙන ක්‍රම, මධ්‍යස්ථානයේ අරමුණු හා පරමාර්ථ විය යුතු ය:—

(අ) මහාචාර්ය පදවි සහ පර්යේෂණ අධි සාමාජිකත්වය ඇති කිරීම සහ මොරටුව විශ්වවිද්‍යාලයේ සහයෝගිත්වය ඇතිව, අදාල විෂයයන් සඳහා පශ්චාත් උපාධි අපේක්ෂක සහ උපාධි අපේක්ෂක පාඨමාලා ප්‍රවර්ධනය කිරීම ;

(ආ) සේවාස්ථ පුහුණුවීමේ පාඨමාලා, සංස්කරණ සම්මේලන හා සාකච්ඡා මුළු මාර්ගයෙන් චන්ද්‍රිකා සහ පෘථිවි පණිවුඩ හුවමාරු කිරීමේ සම්බන්ධතා, දත්ත සැපයීමේ සංකීර්ණ, ගුවන් විදුලි සහ රූපවාහිනී සහ පරිගණක යන්ත්‍රවල දෘඩ කොටස් සහ මෘදු කොටස් වැඩි දියුණු කිරීම යනාදිය සඳහා අවශ්‍ය වන සේවක පිරිස පුහුණු කිරීම ;

(ඇ) නවීන තාක්ෂණ විද්‍යා උපයෝගී කර ගැනීමේ දී සහ කර්මාන්තවලට අවශ්‍ය පුහුණුවීමේ නියමාවලි ඇති කිරීමේ දී පර්යේෂණ සහ කර්මාන්ත සඳහා සංවර්ධන සහාය ද ඇතුළු උපදේශක සේවා සැපයීම ;

(ඈ) පණිවුඩ හුවමාරුව, පරිගණක විද්‍යාව, බලශක්ති අධ්‍යයනය, සහ රොබෝ විද්‍යාව යන විෂයයන් ඉගැන්වීම සහ ඒවා පිළිබඳ පර්යේෂණ පැවැත්වීම, ඒවා පවත්වා ගෙන යාම සහ වැඩි දියුණු කිරීම සඳහා අවශ්‍ය ගොඩනැගිලි, පුස්තකාල සහ පර්යේෂණ විද්‍යාගාර ඉදිකිරීම, ඒවාට බඩුබාහිරාදිය සැපයීම සහ ඒවා පවත්වාගෙන යාම හා වෙනත් සේවාවන් සැපයීම ;

(ඉ) ශ්‍රී ලංකාව සහ සංවර්ධනය වන වෙනත් රටවල අවශ්‍යතා සපුරාලීම සඳහා පණිවුඩ හුවමාරුව සහ පරිගණක විද්‍යාව පිළිබඳ පර්යේෂණ සහ වැඩිදියුණු කිරීම් ආරම්භ කිරීම, ප්‍රවර්ධනය කිරීම සහ පවත්වාගෙන යාම ;

(ඊ) විශේෂයෙන්ම ග්‍රාමීය පණිවුඩ හුවමාරුව සහ පරිගණක උපයෝගී කර ගැනීම් සඳහා විකල්ප බලශක්ති මූලාශ්‍ර ප්‍රයෝජනයට ගැනීම පිළිබඳව පර්යේෂණ පැවැත්වීම සහ ඒවා වැඩිදියුණු කිරීම ආරම්භ කිරීම සහ ප්‍රවර්ධනය කිරීම ;

(උ) ශ්‍රී ලංකාව ඇතුළත සහ වෙනත් රටවල කාර්මික කටයුතුවල නියුක්ත තැනැත්තන් සහ කාර්මික ආයතන සමග සබඳතා ඇති කර ගැනීම සහ පවත්වාගෙන යාම සහ මධ්‍යස්ථානයේ අරමුණු සහ පරමාර්ථ වලට අදාල කරුණු සම්බන්ධයෙන් අන්තර් ජාතික සහයෝගිතාව ඇති කිරීම ;

(ඌ) ජන සන්නිවේදන මාධ්‍ය විශේෂඥයන් සඳහා වැඩිදුර පුහුණු වීම් සලසා දීම ;

(එ) මධ්‍යස්ථානයේ පරමාර්ථ මුදුන් පමුණුවා ගැනීම සඳහා ප්‍රදාන, පරිත්‍යාග, හෝ ශිෂ්‍යත්ව ප්‍රදානය කිරීම ; සහ

(ඒ) මධ්‍යස්ථානයේ අරමුණු සහ පරමාර්ථ ප්‍රවර්ධනය කිරීම සඳහා අවශ්‍ය විය හැකි වෙනත් ක්‍රියා සහ කටයුතු කිරීම.

## II වන කොටස

### මධ්‍යස්ථානයේ පරිපාලනය

4. (1) මධ්‍යස්ථානයේ කටයුතු, පහත දැක්වෙන සාමාජිකයන් ගෙන් සමන්විත විය යුතු (මේ පනතේ "මණ්ඩලය" යනුවෙන් සඳහන් කරනු ලබන) පාලක මණ්ඩලයක් විසින් පරිපාලනය කළ යුතු ය:— මණ්ඩලයේ සාමාජිකයෝ.

(අ) පහත නම් දැක්වෙන නිල බලයෙන් පත්වන සාමාජිකයන් හතර දෙනෙක් :—

(i) උසස් අධ්‍යාපන විෂයය භාර අමාත්‍යවරයාගේ අමාත්‍යාංශයේ ලේකම්වරයා ;

(ii) මොරටුව විශ්වවිද්‍යාලයේ උප කුලපතිවරයා ;

(iii) ශ්‍රී ලංකාවේ පරිගණක සහ තොරතුරු තාක්ෂණ විද්‍යා සභාවේ සභාපතිවරයා ; සහ

(iv) 13 වන වගන්තියෙහි (1) වන උපවගන්තියේ (අ) ඡේදය යටතේ පත් කරනු ලබන, මධ්‍යස්ථානයේ අධ්‍යක්ෂවරයා ;

(ආ) අමාත්‍යවරයා විමසා ජනාධිපතිවරයා විසින් පත් කළයුතු සාමාජිකයන් හය දෙනෙක් ; එයින් හතර දෙනකු පණිවුඩ හුවමාරු කිරීම, පරිගණක විද්‍යාව, අභ්‍යවකාශ සහ බල ශක්ති තාක්ෂණ විද්‍යාවන් උපයෝගි කර ගැනීමේ හෝ වැඩිදියුණු කිරීමේ නියැලුනු හෝ එම ක්ෂේත්‍රවල සෑහෙන වෘත්තීය පළපුරුද්දක් ඇති අය විය යුතු ය ; එසේම එයින් දෙදෙනකු මධ්‍යස්ථානයේ අරමුණුවලට සමාන අරමුණු ඇති යම් ආයතනයක වැඩ සම්බන්ධයෙන් වෘත්තීය වශයෙන් පිළිගැනීමක් ඇති තැනැත්තන් විය යුතු අතර ඔවුන්—

(i) ශ්‍රී ලංකාවේ පදිංචි ;

(ii) මධ්‍යස්ථානය සඳහා අරමුදල් සපයන යම් සංවිධානයක සේවයෙහි නියුක්ත වූ ; හෝ

(iii) මධ්‍යස්ථානයට සෑහෙන මූල්‍ය ආධාර සපයන රටක පදිංචි වූ ;

තැනැත්තන් අතරින් තෝරා ගත හැකි ය ;

(ඇ) (11 වන වගන්තියේ (1) වන උපවගන්තියෙහි සඳහන්) කාර්මික උපදේශක සභාව විසින් එහි සාමාජිකයන් අතරින් තෝරා ගන්නා ලද සාමාජිකයන් දෙදෙනෙක් ; මින් එක් එක් තැනැත්තා අවුරුදු තුනක කාල සීමාවක් සඳහා හෝ ඔහු සභාවේ සාමාජිකයකු වීම අවසන් වන දිනය තෙක් හෝ යන දින දෙකෙන් කලින් එළඹෙන දිනය දක්වා ධුරය දැරිය යුතු ය.

(2) ජනාධිපතිවරයා විසින්, අමාත්‍යවරයා විමසා මණ්ඩලයේ සාමාජිකයන් අතරින් මණ්ඩලයේ සභාපතිවරයා සහ උප සභාපතිවරයා විය යුතු තැනැත්තන් දෙදෙනකු පත් කළ යුතු ය.

(3) ජනාධිපතිවරයා විසින් පත් කරනු ලැබූ සාමාජිකයකු මිය යෑම, ඉල්ලා අස්වීම, හෝ ඉවත් කරනු ලැබීම නිසා ඇති වූ පුරප්පාඩුවක් ජනාධිපතිවරයා විසින් ම පිරවිය යුතු ය. පුරප්පාඩුවක් පිරවීම සඳහා එසේ පත් කරනු ලැබූ යම් තැනැත්තකු, තම පූර්වගාමියාගේ ධූරයේ ඉතිරි කාලසීමාව සඳහා ධූරය දැරිය යුතු ය.

(4) 4 වන වගන්තියේ (1) වන උපවගන්තියෙහි (ඇ) ඡේදය යටතේ තෝරාපත් කරගනු ලැබූ සාමාජිකයකු මිය යෑමෙන්, ඉල්ලා අස්වීමෙන්, කාර්මික උපදේශක සභාවේ සාමාජිකයකු ලෙස ධූරය අවසන් වීමෙන් හෝ ඉවත් කරනු ලැබීමෙන් ඇතිවූ පුරප්පාඩුවක් කාර්මික උපදේශක සභාවෙහි සාමාජිකයකු තෝරා පත් කරගනු ලැබීමෙන් එම සභාව විසින් පිරවිය යුතු අතර එම සාමාජිකයා තම පූර්වගාමියාගේ ඉතිරි ධූර කාලය තුළ දී ධූරය දැරිය යුතු ය.

(5) 4 වන වගන්තියේ (1) වන උපවගන්තියෙහි (ආ) ඡේදය යටතේ ජනාධිපතිවරයා විසින් පත් කරනු ලැබූ හෝ 4 වන වගන්තියේ (1) වන උපවගන්තියෙහි (ඇ) ඡේදය යටතේ කාර්මික උපදේශක සභාව විසින් තෝරා පත් කරනු ලැබූ සාමාජිකයකු විසින් ජනාධිපතිවරයා අමතනු ලැබූ ලිපියකින් ඕනෑම අවස්ථාවක ස්වකීය ධූරයෙන් ඉල්ලා අස්විය හැකි අතර එම ඉල්ලා අස්වීම පිළිගත් බවට ජනාධිපතිවරයා විසින් එම සාමාජිකයාට ලිඛිතව දන්වන තුරු එම ඉල්ලා අස්වීම බලාත්මක නොවිය යුතු ය.

(6) මේ වගන්තිය යටතේ ජනාධිපතිවරයා විසින් පත් කරනු ලැබූ සාමාජිකයකු හේතු ඉදිරිපත් නොකොට ඕනෑම අවස්ථාවක ජනාධිපතිවරයා විසින් ඉවත් කරනු ලැබිය හැකි අතර එසේ ඉවත් කරනු ලැබීම කිසිම අධිකරණයක දී ප්‍රශ්න කරනු නොලැබිය යුතු ය.

මණ්ඩලයේ රැස්වීම් කටයුතු.

5. (1) මණ්ඩලයේ ඕනෑම රැස්වීමක දී සභාපතිවරයා හෝ ඔහු නොමැති අවස්ථාවක දී උප සභාපතිවරයා හෝ ඔවුන් දෙදෙනාම නොමැති අවස්ථාවක දී පැමිණ සිටින සාමාජිකයන් විසින් තෝරා ගනු ලබන සාමාජිකයකු එම රැස්වීමේ මූලසුන දැරිය යුතු ය.

(2) අවශ්‍ය සෑම අවස්ථාවක ම සාමාන්‍ය සැසි වාර ලෙස ද වසරකට වරක් මණ්ඩලයේ පිටරට සාමාජිකයන්ගේ සහභාගිත්වය සඳහා පූර්ණ සැසි වාර ලෙස මණ්ඩලය රැස්විය යුතු ය.

(3) ලිපි මගින් ලබා ගන්නා ලද පිටරට සාමාජිකයන්ගේ අදහස් මණ්ඩලයේ සාමාන්‍ය රැස්වීම්වල දී සභාගත කළ යුතු ය.

(4) මණ්ඩලයේ රැස්වීමක් සඳහා ගණපූරණය සාමාජිකයන් පස්දෙනෙක් විය යුතු ය.

(5) මේ පනතේ විධිවිධානවලට යටත්ව, මණ්ඩලයේ කටයුතු කරගෙන යාම සඳහා මණ්ඩලය විසින් රීති සාදනු ලැබිය හැකි ය.

6. ජනාධිපතිවරයා විසින් අවශ්‍ය යයි සලකනු ලබන තැනැත්තන් විමසා ඔහු විසින් තීරණය කරනු ලැබිය හැකි වූ දීමනා සහ වෙනත් පාරිශ්‍රමික මණ්ඩලයේ සාමාජිකයන්ට ගෙවනු ලැබිය යුතු ය. මණ්ඩලයේ සාමාජිකයන් සඳහා පාරිශ්‍රමික.

7. මණ්ඩලයේ සාමාජිකයන් සඳහා යම් පුරප්පාඩුවක් ඇතිවීමේ හෝ එහි යම් සාමාජිකයකු පත් කිරීමේ දී යම් අඩු ලුහුඩුකමක් සිදුවීමේ හෝ හේතුවෙන් පමණක් මණ්ඩලයේ යම් ක්‍රියාවක් හෝ රැස්වීම් කටයුත්තක් අවලංගු වන ලෙස සලකනු නොලැබිය යුතු ය. යම් පුරප්පාඩුවක් හෝ සාමාජිකයකු පත් කිරීමේ දී සිදු වූ අඩු ලුහුඩුකමක් නිසා මණ්ඩලයේ ක්‍රියාවක් හෝ රැස්වීම කටයුතු අවලංගු නොවන ලෙස සැලකිය යුතු බව.

8. මේ පනත යටතේ ධුරයෙන් ඉවත් කරනු ලැබූ සාමාජිකයකු හැර, ස්වකීය ධුරය අත්හැර යන මණ්ඩලයේ ඕනෑම සාමාජිකයකු නැවත පත් කරනු ලැබීම සඳහා සුදුස්සකු විය යුතු ය. මණ්ඩලයේ සාමාජිකයකු ලෙස නැවත පත් කරනු ලැබීම සඳහා සුදුසුකම්.

9. (1) මේ පනතේ විධිවිධාන සහ තත්කාලයේ බලපවත්නා වෙනත් නීතියක විධිවිධානවලට යටත්ව මණ්ඩලයේ පරමාර්ථ ඉටුකර ගැනීම සඳහා අවශ්‍ය හෝ උපයෝගී වන හෝ ආනුෂංගික වන සියලු කටයුතු කිරීම සඳහා මණ්ඩලයට බලය තිබිය යුතු ය. මණ්ඩලයේ බලතල, කාර්ය සහ කර්තව්‍ය.

(2) (1) වන උපවගන්තිය මගින් පවරනු ලැබ ඇති බලතලවල සාමාන්‍යතාවයට හානියක් නොවන පරිදි, පහත දැක්වෙන බලතල ක්‍රියාත්මක කිරීම සහ කාර්ය සහ කර්තව්‍ය ඉටු කිරීම මණ්ඩලය විසින් කරනු ලැබිය හැකි ය :—

(අ) මධ්‍යස්ථානයේ ප්‍රතිපත්ති සෑදීමේ ආයතනය ලෙස ක්‍රියා කිරීම සහ එහි ප්‍රධාන කාර්ය පටිපාටි සෑදීම හෝ අනුමත කිරීම ;

(ආ) මධ්‍යස්ථානයේ අරමුදල් දරා සිටීම, පාලනය සහ පරිපාලනය කිරීම ;

(ඇ) යම් මිලදී ගැනීමක්, ප්‍රදානයක්, ත්‍යාගයක් හෝ අන්තිම කැමති පත්‍රයකින් දේපළ බැහැර කිරීමක් හෝ වෙනත් හේතුවක් නිසා වූ හේතුවෙන් මධ්‍යස්ථානය වෙත පවරනු ලැබිය හැකි යම් චංචල හෝ නිශ්චල දේපළක් භාර ගැනීම සහ දැරීම සහ එම දේපළ විකිණීම, පැවරීම, හුවමාරු කිරීම හෝ වෙනත් අන්දමකින් බැහැර කිරීම ;

(ඈ) මධ්‍යස්ථානයේ අයවැය අනුමත කිරීම හා මධ්‍යස්ථානයේ මුදල් තත්ත්වය සහ අධ්‍යක්ෂවරයා විසින් ඉදිරිපත් කරනු ලැබිය හැකි පරිදි වූ මධ්‍යස්ථානයේ ප්‍රගති වාර්තා සමාලෝචනය කිරීම ;

(ඉ) මධ්‍යස්ථානයේ පරිපාලනය සඳහා අරමුදල් උපයා ගැනීම සහ මධ්‍යස්ථානය පවත්වාගෙන යාම සඳහා දේශීය මෙන්ම විදේශීය මූලාශ්‍රවලින් මූල්‍ය ආධාර හෝ ද්‍රව්‍යමය ආධාර මගින් ත්‍යාග, ප්‍රදාන හා පරිත්‍යාග ලබා ගැනීම;

(ඊ) පණිවුඩ හුවමාරුව, පරිගණක විද්‍යාව සහ බලශක්ති අධ්‍යයනය ප්‍රවර්ධනය කිරීම සඳහා අරමුදලක් පිහිටුවීම ;

(උ) ප්‍රයෝජනයට නොගන්නා ලද යම් ආදායමක් ද ඇතුළු මධ්‍යස්ථානයට අයත් ඕනෑම මුදලක්, භාර ආඥාපනතේ 20 වන වගන්තියේ හෝ වෙනත් යම් ලිඛිත නීතියක හෝ විධිවිධාන යටතේ ශ්‍රී ලංකාව ඇතුළත ඇති නිශ්චල දේපළ මිල දී ගැනීම නීත්‍යනුකූල වන යම් සුරැකුම් පතක ආයෝජනය කිරීම, ආයෝජන වෙනස් කිරීම, හෝ වියදම් කිරීම සඳහා වහාම අවශ්‍ය නොවන, මධ්‍යස්ථානයට අයත් යම් මුදල් කොටසක් යම් බැංකුවක ස්ථිර තැන්පතු ලෙස තැන්පත් කිරීම ;

(ඌ) ආයතනයේ පරමාර්ථවලට මුළුමනින් ම හෝ අර්ධ වශයෙන් හෝ සමාන පරමාර්ථ ඇති සහ ශ්‍රී ලංකාව ඇතුළත හෝ විදේශයක පිහිටි අධ්‍යාපනික හෝ වෙනත් ආයතන සමග ඇස්විසා මණ්ඩල සහ ශිෂ්‍යයන් හුවමාරු කර ගැනීම සඳහා සහ සාමාන්‍යයෙන් ඔවුන්ගේ පොදු පරමාර්ථවලට හිතකර වන පොදු කාර්ය සඳහා සහයෝගිතා ගිවිසුම්වලට ඇතුළත් වීම ;

(එ) මධ්‍යස්ථානයේ කාර්ය මණ්ඩලයට පත් කිරීම් කිරීම ;

(ඒ) මධ්‍යස්ථානය විසින් ඉටු කරනු ලබන යම් සේවා සඳහා ගාස්තු හෝ අය කිරීම් පැනවීම හෝ පර්යේෂණ සහ සංවර්ධන භාර ගැනීම සඳහා ගිවිසුම්වලට ඇතුළත් වීම ;

(ඔ) ස්වකීය බලතල, කාර්ය සහ කර්තව්‍යවලින් කිසිවක් අධ්‍යක්ෂවරයාට, නියෝජ්‍ය අධ්‍යක්ෂවරයාට, සභාවට හෝ කාරක සභාවලට පැවරීම ;

(ඕ) මධ්‍යස්ථානයේ කටයුතු කළමනාකරණය සම්බන්ධයෙන් රීති සෑදීම ; සහ

(ක) මධ්‍යස්ථානයේ අරමුණු සහ පරමාර්ථ ඉටුකර ගැනීම සඳහා අවශ්‍ය විය හැකි අනිකුත් සියලු ක්‍රියා කිරීම.

රීති සෑදීම සඳහා මණ්ඩලයට ඇති බලය.

**10.** මේ පනත යටතේ රීති සෑදීම සඳහා බලය පවරනු ලැබ ඇත්තේ හෝ අවශ්‍ය වන්නේ යම් කරුණු සඳහා ද ඒ සියලු කරුණු හෝ ඉන් යම් කරුණක් පිළිබඳව මණ්ඩලය විසින් රීති සාදනු ලැබිය හැකි ය.

සභාවක් සහ කාරක සභා පත් කිරීමට මණ්ඩලයට ඇති බලය.

**11.** (1) මණ්ඩලයේ බලතල ක්‍රියාත්මක කිරීමේ දී සහ කාර්ය සහ කර්තව්‍ය ඉටුකිරීමේ දී මණ්ඩලයට සහායවීමේ සහ උපදෙස් දීමේ කාර්යය සඳහා ද එමෙන්ම පනතේ ප්‍රතිපත්ති සහ විධිවිධාන බලාත්මක කිරීමේ කාර්යය සඳහා ද අවශ්‍ය යයි මණ්ඩලය සල කන්නේ යම් කරුණු ද ඒ සියලු කරුණුවල දී හෝ ඉන් යම් කරුණක දී මණ්ඩලයට සහාය වීම සඳහා ද මණ්ඩලය විසින් අවශ්‍ය යයි සලකනු ලබන තාර්මික උපදේශක සභාවක් සහ කාරක සභා මණ්ඩලය විසින් පත් කරනු ලැබිය හැකි ය.

(2) කාර්මික උපදේශක සභාව සාමාන්‍යයෙන් මණ්ඩලයේ ප්‍රතිපත්ති සෑදීම සඳහා සහාය විය යුතු අතර මණ්ඩලයේ ප්‍රතිපත්ති සහ තීරණ ක්‍රියාත්මක කිරීම සඳහා අධ්‍යක්ෂවරයාට සහාය විය යුතු ය.

(3) මධ්‍යස්ථානයේ අධ්‍යක්ෂවරයා, කාර්මික උපදේශක සභාවේ නිල බලයෙන් පත්වන සභාපතිවරයා විය යුතු ය.

(4) මධ්‍යස්ථානයේ නියෝජ්‍ය අධ්‍යක්ෂවරයා, කාර්මික උපදේශක සභාවේ නිල බලයෙන් පත්වන උපසභාපතිවරයා විය යුතු ය.

(5) මොරටුව විශ්වවිද්‍යාලයේ සනාතන සභාව විසින් තීරණය කරනු ලැබිය හැකි පරිදි වූ අදාළ විෂය සම්බන්ධ එම විශ්වවිද්‍යාලයේ මහාචාර්යවරු දෙදෙනෙක් නිලබලයෙන් පත්වන කාර්මික උපදේශක සභාවේ සාමාජිකයන් විය යුතු ය.

(6) කාර්මික උපදේශක සභාවේ සහ මේ වගන්තිය යටතේ පිහිටුවනු ලැබූ සෑම කාරක සභාවකම ධුර කාලය සහ නිශ්චිත බල තල, කාර්ය සහ කර්තව්‍ය මණ්ඩලය විසින් තීරණය කළ යුතු ය.

(7) කාර්මික උපදේශක සභාවේ සහ කාරක සභාවක රැස්වීම් වල දී තිබිය යුතු ගණපූරණය ද ඇතුලුව එම රැස්වීම්වල දී පිළිපැදිය යුතු කාර්ය පරිපාටිය සම්බන්ධයෙන් මණ්ඩලය විසින් රීති සෑදිය හැකි ය.

12. අමාත්‍යවරයා විසින් කලින් කල, මණ්ඩලයේ කටයුතු කර ගෙන යාම සඳහා අවශ්‍ය විය හැකි විශේෂ හෝ සාමාන්‍ය විධාන මණ්ඩලය වෙත නිකුත් කරනු ලැබිය හැකි ය. අමාත්‍යවරයා විසින් සාමාන්‍ය හෝ විශේෂ විධාන නිකුත් කිරීම.

## III වන කොටස

### කාර්ය මණ්ඩලය පත් කිරීම සහ ඔවුන්ගේ විනය පාලනය සහ වෙනත් කරුණු

13. (1) (අ) මධ්‍යස්ථානයේ අධ්‍යක්ෂවරයා, මධ්‍යස්ථානයේ අධ්‍යක්ෂවරයා, නියෝජ්‍ය අධ්‍යක්ෂවරයා සහ වෙනත් නිලධරයන් පත් කිරීම.

(ආ) මධ්‍යස්ථානයේ නියෝජ්‍ය අධ්‍යක්ෂවරයා, සහ

(ඇ) මධ්‍යස්ථානයේ මහාචාර්යවරු

මණ්ඩලය විසින් පත් කරනු ලැබිය යුතු ය.

(2) අධ්‍යක්ෂ ධුරයට තෝරා ගැනීම, අධ්‍යාපනික සහ පර්යේෂණ පළපුරුද්ද ඇති තැනැත්තන් අතරින් සිදු කරන අවස්ථාවක නියෝජ්‍ය අධ්‍යක්ෂ ධුරය සඳහා තෝරා ගැනීම, වෘත්තීය ඉංජිනේරුවරයන් අතරින් කළ යුතු අතර එසේම අධ්‍යක්ෂවරයා, වෘත්තීය ඉංජිනේරුවරයක්ගෙන් තෝරා ගනු ලැබූ අවස්ථාවක නියෝජ්‍ය අධ්‍යක්ෂ ධුරය සඳහා තෝරා ගැනීම අධ්‍යාපනික සහ පර්යේෂණ පළපුරුද්ද ඇති තැනැත්තන් අතරින් කළ යුතු ය. ඒ එක් එක් අවස්ථාවේ දී, පළපුරුද්ද මධ්‍යස්ථානයේ දී භාර ගනු ලබන අධ්‍යාපන ක්ෂේත්‍ර එකකට හෝ ඉන් වැඩි ගණනකට සම්බන්ධ විය යුතු ය.

මධ්‍යස්ථානයේ කාර්ය මණ්ඩලයට පත් කිරීම් සම්බන්ධව මණ්ඩලයට ඇති බලතල.

14. මණ්ඩලය විසින්—

(අ) 13 වන වගන්තියේ (1) වන උපවගන්තිය යටතේ මධ්‍යස්ථානයෙහි කාර්ය මණ්ඩලයේ පත් කිරීම් සම්බන්ධයෙන් සහ එය විසින් එසේ කරනු ලබන කාර්ය මණ්ඩලය සේවයෙන් ඉවත් කිරීම සහ විනය පාලනය කිරීම සම්බන්ධයෙන් බලතල ක්‍රියාත්මක කිරීම ;

එසේ වුව ද මණ්ඩලය විසින් පත් කිරීමේ, සේවයෙන් ඉවත් කිරීමේ සහ විනය පාලනය කිරීමේ බලතල මෙහි මින්මතු දක්වෙන පරිදි අධ්‍යක්ෂවරයා වෙත පැවරිය හැකි ය.

(ආ) කාර්ය මණ්ඩලයේ වේතන හෝ වැටුප් හෝ වෙනත් පාරිශ්‍රමික නියම කිරීම ;

(ඇ) එම කාර්ය මණ්ඩලයේ සේවා කොන්දේසි සහ නියමයන් නිර්ණය කිරීම ; සහ

(ඈ) 1958 අංක 15 දරන සේවක අර්ථ සාධක අරමුදල් පනතේ විධිවිධාන සලස්වා ඇති පරිදි මණ්ඩලයේ සේවා නියුක්තයන් සඳහා එම පනත යටතේ දායක මුදල් ගෙවීම සඳහා විධිවිධාන සැලැස්වීම,

කළ හැකි ය.

අධ්‍යක්ෂවරයාගේ සහ නියෝජ්‍ය අධ්‍යක්ෂවරයාගේ බලතල.

15. (1) අධ්‍යක්ෂවරයා :—

(අ) මණ්ඩලයේ ප්‍රතිපත්ති සහ නීරණවලට අනුව මධ්‍යස්ථානයේ කළමනාකරණය සහ පරිපාලනය පිළිබඳව වගකිව යුතු ය ;

(ආ) තමා වෙත පවරනු ලැබිය හැකි බලතල ක්‍රියාත්මක කිරීම සහ කාර්යයන් සහ කර්තව්‍යයන් ඉටු කිරීම කළ යුතු ය ;

(ඇ) මහාචාර්යවරුන් හැර මධ්‍යස්ථානයේ ශාස්ත්‍රීය කාර්ය මණ්ඩලය පත් කළ යුතු ය ;

(ඈ) මධ්‍යස්ථානයේ කාර්ය සඳහා අවශ්‍ය විය හැකි නිලධරයන් සහ වෙනත් සේවා නියුක්තයන් මධ්‍යස්ථානයේ කාර්ය මණ්ඩලයට පත් කළ යුතු ය ; තව ද

(ඉ) මධ්‍යස්ථානයේ ප්‍රධාන ගිණුම් නිලධරයා විය යුතු ය.

(2) (අ) මේ පනත යටතේ අධ්‍යක්ෂවරයාගේ බලතල ක්‍රියාත්මක කිරීමේ දී හා කාර්ය සහ කර්තව්‍ය ඉටු කිරීමේ දී නියෝජ්‍ය අධ්‍යක්ෂවරයා ඔහුට සහාය විය යුතු ය.

(ආ) නියෝජ්‍ය අධ්‍යක්ෂවරයා මණ්ඩලයට කෙලින්ම වගකිවයුතු නිශ්චිත බලතල සහ කාර්ය, මණ්ඩලය විසින් ඔහු වෙත පවරනු ලැබිය හැකි ය.

(3) අධ්‍යක්ෂවරයාගේ සහ නියෝජ්‍ය අධ්‍යක්ෂවරයාගේ පාරිශ්‍රමික ද ඇතුළු රැකියාවේ නියමයන් සහ කොන්දේසි මණ්ඩලය විසින් නිර්ණය කරනු ලැබිය යුතු ය.

රජයේ නිලධරයන් සහ පළාත් පාලන සේවයේ සේවා නියුක්තයන් මධ්‍යස්ථානයේ කාර්ය මණ්ඩලයට පත් කිරීම.

**16.** (1) මණ්ඩලයේ ඉල්ලීම පරිදි, රාජ්‍ය සේවයේ යම් නිලධරයකු එම නිලධරයාගේ සහ රාජ්‍ය පරිපාලනය භාර අමාත්‍යවරයාගේ අමාත්‍යාංශයේ ලේකම්වරයාගේ හෝ අදාළ අමාත්‍යාංශයේ හෝ කැමැත්ත ඇතිව මණ්ඩලය විසින් තීරණය කරනු ලැබිය හැකි වූ කාල සීමාවක් සඳහා මධ්‍යස්ථානයේ කාර්ය මණ්ඩලයට තාවකාලිකව පත් කරනු ලැබිය හැකි ය; නැතහොත් එම කාර්ය මණ්ඩලයට ස්ථිරව පත් කරනු ලැබිය හැකි ය.

(2) රාජ්‍ය සේවයේ යම් නිලධරයකු මධ්‍යස්ථානයේ කාර්ය මණ්ඩලයට තාවකාලිකව පත් කරනු ලැබූ අවස්ථාවක, 1978 අංක 19 දරන ගමනාගමන මණ්ඩල පනතේ 13 වන වගන්තියේ (2) වන උපවගන්තියේ විධිවිධාන, අවශ්‍ය වෙනස් කිරීම් සහිතව, ඔහුට සහ ඔහු සම්බන්ධයෙන් අදාළ විය යුතු ය.

(3) රාජ්‍ය සේවයේ යම් නිලධරයකු මධ්‍යස්ථානයේ කාර්ය මණ්ඩලයට ස්ථිරව පත් කරනු ලැබූ අවස්ථාවක, 1978 අංක 19 දරන, ගමනාගමන මණ්ඩල පනතේ 13 වන වගන්තියේ (3) වන උපවගන්තියේ විධිවිධාන, අවශ්‍ය වෙනස් කිරීම් සහිතව, ඔහුට සහ ඔහු සම්බන්ධයෙන් අදාළ විය යුතු ය.

(4) නිශ්චිත කාලසීමාවක් සඳහා රජයට සේවය කිරීම සඳහා රජය සමග ගිවිසුමකට බැඳී සිටින යම් තැනැත්තකු මණ්ඩලය විසින් සේවයේ නියුක්ත කරනු ලබන අවස්ථාවක, එම තැනැත්තා විසින් මධ්‍යස්ථානයට සේවය කරනු ලබන යම් කාලසීමාවක්, එම ගිවිසුමේ කොන්දේසි ඉටු කිරීමේ කාර්ය සඳහා රජයට සේවය කිරීමේ කාලසීමාවක් ලෙස සලකනු ලැබිය යුතු ය.

(5) මණ්ඩලයේ ඉල්ලීම පරිදි, පළාත් පාලන සේවයේ හෝ යම් පළාත් පාලන ආයතනයක හෝ යම් නිලධරයකු හෝ යම් සේවා නියුක්තයකු එම නිලධරයාගේ හෝ සේවා නියුක්තයාගේ සහ අවස්ථෝචිත පරිදි පළාත් පාලන ආයතනයේ කැමැත්ත ඇතිව මණ්ඩලය විසින් තීරණය කරනු ලැබිය හැකි වූ කාලසීමාවක් සඳහා, මණ්ඩලය සහ පළාත් පාලන සේවා උපදේශක මණ්ඩලය හෝ එම පළාත් පාලන ආයතනය අතර එකඟත්වයකට පැමිණිය හැකි පරිදි වූ විශ්‍රාම වැටුප් හෝ අර්ථසාධක අරමුදල් පිළිබඳ අයිතිවාසිකම් ද ඇතුළු නියමයන් සහ කොන්දේසි මත මධ්‍යස්ථානයේ කාර්ය මණ්ඩලයට තාවකාලිකව පත් කරනු ලැබිය හැකි ය; නැතහොත් එම කාර්ය මණ්ඩලයට ස්ථිරව පත් කරනු ලැබිය හැකි ය.

## IV වන කොටස

### මධ්‍යස්ථානයේ අංශ සහ ශාස්ත්‍රීය කාර්ය මණ්ඩලය

මධ්‍යස්ථානයේ අංශ.

**17.** මණ්ඩලය විසින්, තීරණය කරනු ලැබිය හැකි වූ (මෙහි මින්මතු "අංශ" යනුවෙන් සඳහන් කරනු ලබන) අධ්‍යයන අංශ වලින් මධ්‍යස්ථානය සමන්විත විය යුතු ය.

අංශවල ශාස්ත්‍රීය කාර්ය මණ්ඩලය.

18. එක් එක් අංශයේ ශාස්ත්‍රීය කාර්ය මණ්ඩලය පහත සඳහන් තැනැත්තන්ගෙන් සමන්විත විය යුතු ය :—

(අ) මහාචාර්යවරු ;

(ආ) පර්යේෂණ අධිසාමාජිකයන් ; සහ

(ඇ) මණ්ඩලය විසින් තීරණය කරනු ලබන වෙනත් අංශවල තැනැත්තන්.

මහාචාර්ය වරයකුට, අධ්‍යක්ෂවරයා හෝ නියෝජ්‍ය අධ්‍යක්ෂවරයා ලෙස කටයුතු කළ හැකි බව.

19. යම් අංශයක මහාචාර්යවරයකුට, මහාචාර්යවරයකු ලෙස සිය කර්තව්‍ය ඉටු කිරීමට අමතරව, අධ්‍යක්ෂවරයා හෝ නියෝජ්‍ය අධ්‍යක්ෂවරයා ලෙස කටයුතු කළ හැකි ය.

මධ්‍යස්ථානයේ වෘත්තීය සහ ශාස්ත්‍රීය කාර්ය මණ්ඩලය.

20. අධ්‍යක්ෂවරයා, නියෝජ්‍ය අධ්‍යක්ෂවරයා, මහාචාර්යවරු, පර්යේෂණ අධි සාමාජිකයන් සහ මණ්ඩලය විසින් තීරණය කරනු ලබන වෙනත් සියලුම අංශවල සිටින තැනැත්තන් යන සියල්ලන් ගෙන්ම මධ්‍යස්ථානයේ වෘත්තීය කාර්ය මණ්ඩලය සමන්විත විය යුතු ය.

## V වන කොටස

## මුදල්

ඕනෑම මූලාශ්‍රයකින් ආධාර ලබාගැනීමට මධ්‍යස්ථානයට හිමිකම් ඇති බව.

21. තම අරමුණු සහ පරමාර්ථ ඉටු කර ගැනීමේ කාර්ය සඳහා ශ්‍රී ලංකාවේ හෝ පිටරටක හෝ යම් මූලාශ්‍රයකින් ප්‍රදාන ලබා ගැනීමට ද සංස්ථාගත කළ හෝ නොකළ යම් ආයතනයක් හෝ පුද්ගල මණ්ඩලයක් සමග හෝ එම ප්‍රදාන සම්බන්ධයෙන් කෙලින්ම අදහස් හුවමාරු කර ගැනීමට ද මධ්‍යස්ථානයට හිමිකම් තිබිය යුතු ය.

රජයේ ආධාර.

22. මධ්‍යස්ථානයේ අරමුණු සහ පරමාර්ථ ඉටු කර ගැනීමේ කාර්ය සඳහා ප්‍රමාණවත් ආධාර මුදලක් රජය විසින් වාර්ෂිකව මධ්‍යස්ථානයට පරිත්‍යාග කළ හැකි ය.

මධ්‍යස්ථානයේ අරමුදල්.

23. (1) මධ්‍යස්ථානයට අයත් අරමුදලක් එය සතුව තිබිය යුතු ය.

(2) මධ්‍යස්ථානයේ අරමුදලට පහත සඳහන් මුදල් ගෙවනු ලැබිය යුතුය :—

(අ) මධ්‍යස්ථානය පිහිටුවීම පිළිබඳව සැලකිලිමත්වන සංවිධාන මගින් සපයනු ලැබිය හැකි සියලු මුදල් ;

(ආ) මධ්‍යස්ථානයේ ප්‍රයෝජනය සඳහා පාර්ලිමේන්තුව විසින් කලින් කල සම්මත කරනු ලැබිය හැකි සියලු මුදල් ;

(ඇ) ස්වකීය බලතල ක්‍රියාත්මක කිරීමේ දී හා කාර්ය හා කර්තව්‍ය ඉටු කිරීමේ දී මධ්‍යස්ථානය විසින් ලැබිය හැකි සියලු මුදල් ; සහ

(ඈ) ශ්‍රී ලංකාව ඇතුළත හෝ පිටරට ඇති ඕනෑම මූලාශ්‍රයකින් ණය, පරිත්‍යාග, ත්‍යාග හෝ ප්‍රදාන වශයෙන් මධ්‍යස්ථානය විසින් ලැබිය හැකි සියලු මුදල් :

එසේ වුවද, නිශ්චිත කාර්ය සඳහා දෙනු ලැබූ ආධාර මුදල්වලින් හෝ නිශ්චිත පරමාර්ථ සඳහා දෙනු ලැබූ ප්‍රදානවලින් හෝ ලැබුණු යම් ආදායමක් මධ්‍යස්ථානයේ ගිණුම්වල වෙන් වශයෙන් ගිණුම් තැබිය යුතු අතර එම ආධාර හෝ ප්‍රදාන දෙනු ලැබුවේ යම් කාර්යයක් හෝ පරමාර්ථයක් උදෙසා ද ඒ කාර්ය හෝ පරමාර්ථ සඳහා හැර මධ්‍යස්ථානයේ සාමාන්‍ය කාර්ය සඳහා එම ආදායමෙන් මුදල් ගෙවනු නොලැබිය යුතු ය.

24. මධ්‍යස්ථානයේ බලතල ක්‍රියාත්මක කිරීමේ දී හා කාර්ය හා කර්තව්‍ය ඉටු කිරීමේ දී මධ්‍යස්ථානය විසින් දරන ලද යම් වියදමක් පියවීම සඳහා අවශ්‍ය වන සියලු මුදල්, මධ්‍යස්ථානයේ අරමුදලින් ගෙවනු ලැබිය යුතු ය. අරමුදලින් මුදල් ගෙවීම.

25. මධ්‍යස්ථානයේ අරමුදලින් යම් මුදලක් ආපසු ලබා ගැනීමේ ක්‍රමය හා ආකාරය සහ අරමුදලින් යම් මුදලක් ආයෝජනය කිරීම, එම කාර්ය සඳහා මණ්ඩලය විසින් කලින් කල සාදනු ලැබූ රීති වලට එකඟව සිදුකළ යුතු අතර එම රීතිවලට එකඟව මිස කිසිම මුදලක් ආපසු ලබා නොගත යුතු ය. අරමුදලේ මුදල් ආපසු ලබාගැනීම හා ආයෝජනය කිරීම.

26. යම් පළාත් පාලන ආයතනයක් විසින් පනවනු ලැබූ යම් වරිපනම් සහ බදුවලින් මධ්‍යස්ථානය නිදහස් විය යුතු ය. යම් පළාත් පාලන ආයතනයක් විසින් පනවනු ලැබූ යම් වරිපනම් සහ බදුවලින් මධ්‍යස්ථානය නිදහස් විය යුතු බව.

27. (1) මධ්‍යස්ථානයේ මුදල් වර්ෂය විය යුත්තේ ලිත් වර්ෂයයි. මධ්‍යස්ථානයේ මුදල් වර්ෂය සහ ගිණුම් විගණනය.

(2) මධ්‍යස්ථානයේ ආදායම් සහ වියදම්වල ද, වත්කම් සහ බැරකම් වල ද වෙනත් සියලු ගනුදෙනුවල ද සුදුසු ලෙස ගිණුම් පොත් තැබීමට මණ්ඩලය කටයුතු සැලැස්විය යුතු ය.

(3) මණ්ඩලයේ ගිණුම්, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 වන ව්‍යවස්ථාවට අනුකූලව විගණකාධිපතිවරයා, විසින් විගණනය කළ යුතු ය.

(4) මධ්‍යස්ථානයේ විගණකවරුන්ගේ පාරිශ්‍රමික මණ්ඩලය විසින් තීරණය කළ යුතු ය.

28. මධ්‍යස්ථානයේ ප්‍රයෝජනය සඳහා අවශ්‍යයයි සැලකිය හැකි ඉඩම්, ගොඩනැගිලි සහ වෙනත් පහසුකම් රජය මගින් සැපයිය හැකි ය. මධ්‍යස්ථානයේ ප්‍රයෝජනය සඳහා පරිශ්‍ර රජය මගින් සැපයිය යුතු බව.

## VI වන කොටස

### සාමාන්‍ය

මණ්ඩලයේ සාමාජිකයන් සහ මධ්‍යස්ථානයේ නිලධරයන් ආරක්ෂා කිරීම.

29. (1) (අ) මේ පනත යටතේ මණ්ඩලය විසින් සද්භාවයෙන් කරනු ලැබූ හෝ කරන ලදැයි සැලකෙන හෝ යම් ක්‍රියාවක් සම්බන්ධයෙන් මණ්ඩලයට විරුද්ධව ; හෝ

(ආ) මධ්‍යස්ථානයේ යම් සාමාජිකයකු, නිලධරයකු, සේවා නියුක්තයකු හෝ අනුයෝජිතයකු විසින් මේ පනත යටතේ හෝ මණ්ඩලයේ විධානය පරිදි කරනු ලැබූ හෝ කරන ලදැයි සැලකෙන යම් ක්‍රියාවක් සම්බන්ධයෙන් ඔහුට විරුද්ධව

කිසිම සිවිල් හෝ අපරාධ නඩුවක් නොපැවරිය යුතු ය.

(2) මණ්ඩලය විසින් හෝ මණ්ඩලයට විරුද්ධව හෝ යම් අධිකරණයක පවරන ලද සිවිල් හෝ අපරාධ නඩුවක දී, මණ්ඩලයට දරන්නට සිදු වූ යම් වියදමක් මධ්‍යස්ථානයේ අරමුදලින් ගෙවිය යුතු අතර, එවැනි යම් සිවිල් හෝ අපරාධ නඩුවක දී මණ්ඩලයට ගෙවනු ලබන හෝ මණ්ඩලය විසින් අයකර ගනු ලබන හෝ යම් ගාස්තු අරමුදලට බැර කරනු ලැබිය යුතු ය.

(3) (1) වන උපවගන්තියේ (ආ) ඡේදයේ සඳහන් යම් තැනැත්තකු විසින් මේ පනත යටතේ හෝ මණ්ඩලයේ විධාන මත කරනු ලැබූ හෝ කරන ලදැයි සැලකෙන යම් ක්‍රියාවක් සම්බන්ධයෙන් ඔහුට විරුද්ධව යම් අධිකරණයක පවරන ලද යම් සිවිල් හෝ අපරාධ නඩුවක දී ඔහු විසින් දරන ලද යම් වියදමක්, ඔහු විසින් ඒ ක්‍රියාව සද්භාවයෙන් කරනු ලැබූ ක්‍රියාවක් බව ඒ අධිකරණය තීරණය කළහොත් ඒ වියදම ඔහු විසින් ඒ සිවිල් හෝ අපරාධ නඩුවේ දී අයකර ගනු ලැබ නොමැති නම්, මධ්‍යස්ථානයේ අරමුදලින් ගෙවනු ලැබිය යුතු ය.

මණ්ඩලයේ සාමාජිකයකුට හෝ සාමාජිකයකුගේ දේපළට හෝ මධ්‍යස්ථානයේ නිලධරයකුට විරුද්ධව රිට් ආඥාවක් නිකුත් නොකළ යුතු බව.

30. මධ්‍යස්ථානයට විරුද්ධව පවරනු ලබන නඩුවක දී, මණ්ඩලයේ යම් සාමාජිකයකුට විරුද්ධව හෝ මධ්‍යස්ථානයේ යම් නිලධරයකුට, සේවා නියුක්තයකුට හෝ අනුයෝජිතයකුට විරුද්ධව හෝ ඔහුගේ දේපළට විරුද්ධව හෝ කිසිම රිට් ආඥාවක් නිකුත් නොකළ යුතු ය.

අල්ලස් පනතේ අර්ථානුකූලව මධ්‍යස්ථානය උපලේඛනගත ආයතනයක් ලෙස සලකනු ලැබිය යුතු බව.

31. අල්ලස් පනතේ අර්ථානුකූලව, මධ්‍යස්ථානය උපලේඛනගත ආයතනයක් ලෙස සලකනු ලැබිය යුතු අතර, ඒ අනුව පනතේ විධිවිධාන තේරුම් ගත යුතු ය.

පාර්ලිමේන්තුවේ පනත් කෙටුම්පත්වල සහ නීතිවල වාර්ෂික දායක මිල (දේශීය) රු. 150 කි. (විදේශීය) රු. 200 කි. කොළඹ 1, තැ. පෙ. අංක 500, රජයේ ප්‍රකාශන කාර්යාංශයේ අධිකාරී වෙත සෑම වර්ෂයකම දෙසැම්බර් මස 15 වැනි දිනට පෙර දායක මුදල් ගෙවා පසුව එළඹෙන එක් එක් වර්ෂය සඳහා ඒවා ලබාගත හැකිය.